ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No . | දිනය / திகதி / Date. 2024-09-10 |

පැමිණිලි පාර්ශවය: 01. බී.ජේ.මානවඩු
01 පටුමග
බෝධිරාජපුර
කුරුන්දන්කුලම
අනුරාධපුර

02. ආර්.එම්.සම්පත් සදරුවන් රත්නායක
ඉහළ මැදගම
කුඹුක්ගැටේ

03. ඒ.පී.එල්.ජීවනි වෙලේකොරටුව
ගලගම උතුර
නාකුළුගමුව

වගඋත්තරකාර පාර්ශවය: සාමාන්‍යාධිකාරී
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
ගාලු පාර
රත්මලාන

**පැමිණිලි අංකය : HRC/ANU/292/2022(S)**

**පැමිණිලිකරුවන්ගේ පැමිණිල්ල :**

බී.ජේ.මානවඩු, ආර්.එම්. සම්පත් සඳරුවන් රත්නායක, ඒ.ඩී.එල්. ජීවනි වෙලේකොරටුව යන පැමිණිලිකරුවන් තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සැළසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද ලිඛිත විභාගයට පෙනී සිට එම විභාගයෙන් සමත්ව 2022.01.21 වන දින ජාතික ජලසම්පාදන මණ්ඩලයේ රත්මලාන ප්‍රධාන කාර්යාලයේ පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ බවත්, මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා 21දෙනෙකු තෝරාගෙන සිටි බවත්, ඉන් දෙදෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ බවත්, පැමිණිලිකරුවන් තිදෙනා හැර අනෙක් සියලුදෙනාට සැළසුම් ශිල්පී පත්වීම ලබා දී ඇති බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලිකරුවන් තිදෙනාට පත්වීම් නොලැබීම සම්බන්ධයෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මානව සම්පත් අංශය දැනුවත් කර ඇති අතර, එහිදි පැමිණිලිකරුවන්ට දැන ගන්නට ලැබී ඇත්තේ වෘත්තීය පුහුණු අධිකාරියේ සැලසුම් ශිල්පය පිළිබඳ පුහුණුව ලබා ඇති පැමිණිලිකරුවන්ගේ සහතික තහවුරු කිරීමක් අවශ්‍ය වන බවයි.

තවදුරටත් පැමිණිලිකරුවන් තිදෙනාට පත්වීම ප්‍රදානය කිරීම පමා වූ බැවින් මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලූ බවත්, එහිදී දැන ගන්නට ලැබුණේ කාර්මික විද්‍යාලවලින් සැළසුම් ශිල්පය හැදෑරූ අයට පමණක් අදාළ පත්වීම් ලබාදී ඇති බවයි. එමෙන්ම ජාතික ජලසම්පාදන මණ්ඩලයේ සැලසුම් ශිල්පීන්ගේ වෘත්තීය සමිතිය විසින් පැමිණිලිකරුවන් තිදෙනාට පත්වීම් ලබාදීම පිළිබඳව විරුද්ධත්වය පලකර ඇති බැවින් තමන් තිදෙනා ප්‍රතික්ෂේප වී ඇති බවත්, සැළසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා වන වෘත්තීය සහතිකය කාර්මික විද්‍යාල වලින් හා තාක්ෂණික විද්‍යාලවලින් පමණක් ලබා ගත යුතු බවත් මෙම ආයතන වලින් ලබා ගන්නා සහතික පමණක් පිළිගනු ලබන බවත් වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු සහතිකය පිළිනොගන්නා බවත් ඔවුන් දන්වා ඇති බවත් ය.

මෙලෙස තම වෘත්තීය සුදුසුකම පිළිනොගෙන කාර්මික විද්‍යාලවලින් සුදුසුකම් ලබාගත් අයදුම්කරුවන්ට පමණක් පත්වීම ලබාදීමත් පැමිණිලිකරුවන්ගේ වෘත්තීය සුදුසුකම ප්‍රතික්ෂේප කිරීමත් තුලින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකරුගේ ප්‍රකාශය :</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් අංක P9- ඒ/සැළසුම් ශිල්පී/ බඳවා ගැනීම් හා 2022.09.12 දිනැති වාර්තාව මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මානව සම්පත් ) විසින් කියා සිටින්නේ, “සැමට ජලය” ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ සැළසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා මණ්ඩලයේ අනුමත බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය අනුව අයදුම්පත් කැඳවන ලද බවයි.

“සැමට ජලය” ව්‍යාපෘතිය සඳහා රජයේ කාර්මික විද්‍යාලවල එක් අවුරුදු සැළසුම් ශිල්පී පූර්ණ කාලීන පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් 15දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද බවත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු අධිකාරිය මගින් එක් අවුරුදු පූර්ණ කාලීන සැළසුම් ශිල්පී පාඨමාලාව හදාරා ඇති අය බාහිර අයදුම්කරුවන් ලෙස ලිඛිත පරීක්ෂණයට යොමුකර ඉන් සමත් වූ අය තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ඇති බවත් දක්වා ඇත.

මේ අවස්ථාවේදී සැළසුම් ශිල්පීන්ගේ වෘත්තීය සමිතිය විසින් රජයේ කාර්මික විද්‍යාලවල සැළසුම් ශිල්පී එක් අවුරුදු පාඨමාලාවන් හා වෘත්තීය පුහුණු අධිකාරියේ සැළසුම් ශිල්පී එක් අවුරුදු පාඨමාලාවේ විෂය අන්තර්ගතය සමාන නොවන බැවින් හා මණ්ඩලය මේ දක්වාම සැළසුම් ශිල්පී තනතුරට බඳවා ගනු ලැබුවේ රජයේ කාර්මික විද්‍යාලවලින් පූර්ණ කාලීන පාඨමාලාව හදාරන ලද අය පමණක් වන බැවින්

වෘත්තිය පුහුණු අධිකාරියේ පාඨමාලාව හදාරා ඇති අය බඳවා ගැනීම සම්බන්ධයෙන් වෘත්තීය සමිතිය විසින් දැඩි විරෝධය පල කර ඇත.

මේ සම්බන්ධයෙන් අදාල වෘත්තිය සමිතිය සමඟ මණ්ඩලයේ ඉහළ කළමණාකාරිත්වය සාකච්ඡා කිහිපයක් පවත්වන ලද බවත්, එහිදී තීරණය කරන ලද්දේ වෘත්තීය පුහුණු අධිකාරියේ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව හදාරා ඇති අයගේ විෂය අන්තර්ගතය හා රජයේ කාර්මික විද්‍යාලවලින් පූර්ණකාලින පාඨමාලාව හදාරා ඇති අයගේ විෂය අන්තර්ගතයේ කිසියම් වෙනස්කමක් පවතීද යන්න පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් සනාථ කිරීමක් කර ගන්නා ලෙස බවත්, ඒ අනුව ඒ පිළිබඳව විමසා ලිපියක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යවන ලද බවත්, මෙතෙක් එම ලිපියට පිළිතුරු නොලද බවත් දක්වා ඇත. (පරීක්ෂණ අවස්ථාව වන විට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිතුරු යොමු කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය)

ඒ අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පැහැදිලි කිරීම ලැබෙනතෙක් වෘත්තීය පුහුණු ආයතනයකින් එක් අවුරුදු සැලසුම් ශිල්පි පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් තීරණයක් ගත නොහැකි බවත් වැඩිදුරටත් දක්වා ඇත.

එමෙන්ම මේ වන විට "සැමට ජලය" ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කර ඇති බැවින් හා මුදල් අමාත්‍යාංශයේ අංක BD/LBP/01/01/04-2022 හා 2022.04.26 දින දරණ චක්‍රලේඛණයට අනුව නව බඳවා ගැනීම් අත්හිටුවීමට උපදෙස් ලැබී ඇති බැවින් මේ වන විට මණ්ඩලයේ බඳවාගැනීම් තාවකාලිකව නතර කර ඇති බව සඳහන් කර ඇත.

<u>පරීක්ෂණයේදී සහ වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනා මගින් අනාවරණය වූ කරුණු :</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පාර්ශව කැඳවා 2023.02.22 දින කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් පවත්වන ලද අතර, මෙම පරීක්ෂණය සඳහා ඉහත වගඋත්තරකරු වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුරාධපුර කාර්යාලයේ සේවයේ නියුතු මානව සම්පත් නිලධාරී ජී.එම්.එම්.මල්රාජ් මහතා පෙනී සිටින ලදී. පරීක්ෂණයේදී ඔහු දන්වා සිටියේ විට "සැමට ජලය" ව්‍යාපෘතිය සඳහා සැළසුම් ශිල්පීන් බඳවා ගැනිම සඳහා පුවත්පත් දැන්වීමක් පලකරන ලද බවයි.

මෙම දැන්වීමට අනුව අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වන ලද බවත්, එම ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ 17 දෙනෙකු 2022.01.21 දින සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද බවත්, ඒ අනුව පුරප්පාඩු 17ක් පිරවීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලද බවය. මේ වන විට සම්මුඛ පරීක්ෂණයෙන්

තෝරාගත් 15 දෙනෙකු සේවයේ යෙදෙන බවත්, මෙම පැමිණිලිකරුවන් තිදෙනා සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් ලැබුවද ඔවුන් අදාළ තනතුරට බඳවා ගෙන නොමැති බවයි.

මෙම අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමට නොහැකි වූයේ, ඔවුන් තම වෘත්තීය පුහුණුව වෘත්තීය පුහුණු අධිකාරියේ හදාරා තිබීම හේතුකොට ගෙන වන බවත්, මෙම වෘත්තීය පුහුණු සහතිකය පිළිබඳව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් කරුණු තහවුරු කර ගැනීමක් කරගෙන ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුවන් හදාරා ඇති පාඨමාලාව අදාළ තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකමක් ලෙස පිළිගත හැකි බවටත් කරුණු ඉදිරිපත් විය.

වැඩිදුරටත් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරුවන් අදාල තනතුර ලබා ගැනිම සඳහා සුදුසුකම් සපුරා සිටියද, "සැමට ජලය" ව්‍යාපෘතිය මෙ වන විට අවසන් වී ඇති බවත්, මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛනය ප්‍රකාරව නව පත්වීම් ලබාදීම මේ අවස්ථාවේ සිදුකල නොහැකි බවත්, ඉදිරි දිනයකදී ඇතිවන පුරප්පාඩු අනුව බඳවා ගැනීම් සිදුකිරීමේදී මෙම පැමිණිලිකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමේ හැකියාව ඇති බවත් ය.

තවද මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අංක පී1/අති.සා/උසස්වීම් සහ 2024.05.10 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් වැඩ බලන අතිරේක සාමාන්‍යාධිකාරි(මානව සම්පත් කළමණාකරන) විසින් දන්වා සිටින්නේ, පැමිණිලිකරුවන් සමඟ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් කොන්ත්‍රාත් පදනම මත ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත බඳවා ගත් සැලසුම් ශිල්පින් 12 දෙනෙකු මෙ වන විට සැලසුම් ශිල්පී තනතුරේ ස්ථිර කර ඇති බවයි.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.09.05 දින නැවත වරක් පරීක්ෂණයක් පවත්වන ලද අතර, එහිදී අනාවරණය වූයේ කොන්ත්‍රාත් පදනමින් සැලසුම් ශිල්පී තනතුර සඳහා බඳවාගත් 16දෙනෙකු අතරින් 13දෙනෙක් ආයතනයේ අනුමත සේවක සැලසුමේ ඇති වන පුරප්පාඩු අනුව වරින් වර සේවයේ ස්ථිර කිරීමට කටයුතු කර ඇති බවත් අනෙකුත් සේවකයින් තිදෙනා සේවයේ ස්ථිර කිරීමට පෙර සේවයෙන් ඉල්ලා අස්වී ඇති බවත් ය.

<u>නිරීක්ෂණ :</u>

පැමිණිලිකරුවන් කියා සිටින්නේ ජාතික ජල සම්පාදන මණ්ඩලයේ "සැමට ජලය" ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනමින් සැළසුම් ශිල්පී තනතුරට බඳවා ගැනිම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට ඔවුන් ඉදිරිපත්ව ඉන් සමත්වූ නමුත් ඔවුන් තිදෙනා හට පත්වීම් ලබා නොදී සිටීමෙන් වගඋත්තරකරුවන් තම මූලික අයිතිවාසිකම් කඩ කරන ලද බවයි.

වගඋත්තරකර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව, ජලසම්පාදන මණ්ඩලයේ "සැමට ජලය" ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනමින් සැළසුම් ශිල්පී බඳවා ගැනිම සඳහා පුවත්පත් දැන්වීම් පල කර, එහිදී ලද

අයදුම්පත්‍ර අනුව අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා යොමුකර එම ලිඛිත පරීක්ෂණයෙන් සමත්වූවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා යොමුකර ඇති බවත්, එම සම්මුඛ පරීක්ෂණය සඳහා ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් තිදෙනා ද පෙනී සිට ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙහිදී පුරප්පාඩු 17ක් පිරවීම සඳහා කටයුතු කරන ලද බවටත්, එම පුරප්පාඩු 17 අනුව අයදුම්කරුවන් 15 දෙනෙකු බඳවා ගත් බවද වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුවන් තිදෙනා ව්‍යාපෘතිය සඳහා බඳවා ගැනීමට නොහැකිව ඇත්තේ පැමිණිලිකරුවන් විසින් සැළසුම් ශිල්පී පාඨමාලාව වෘත්තීය පුහුණු අධිකාරිය වෙතින් ලබාගෙන තිබීම මත ජාතික ජලසම්පාදන මණ්ඩලයේ වෘත්තීය සමිති විසින් දැඩි විරෝධයක් දැක්වීම හේතුවෙන් බව ද වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම හරහා නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන්ගේ එක් අවුරුදු පූර්ණ කාලීන සැළසුම් ශිල්පී පාඨමාලාව වෘත්තීය පුහුණු අධිකාරියෙන් ලබා තිබීමත්, මෙතෙක් ජල සම්පාදන මණ්ඩලවලට සැළසුම් ශිල්පීන් බඳවාගෙන ඇත්තේ කාර්මික විද්‍යාලයේ පූර්ණ කාලීන එක් අවුරුදු සැළසුම් ශිල්පී පාඨමාලාව හදාරා ඇති අය වීමත් යන හේතුව මත ජාතික ජලසම්පාදන මණ්ඩලයේ වෘත්තිය සමිති විසින් පැමිණිලිකරුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් විරෝධතාවය දක්වා ඇති අතර, අදාළ පාඨමාලා විෂයන් සමාන නොවන බවට වෘත්තීය සමිති විසින් දැන්වීම හේතුවෙන් මේ පිළිබඳව තෘතීයික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාවෙන් පැහැදිලි කර ගැනීමක් කර ගැනීමෙන් අනතුරුව පැමිණිලිකරුවන් තිදෙනා සම්බන්ධයෙන් සලකා බැලීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇත.

ඒ අනුව තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත 2022.08.29 දිනැති TVEC/5/2 දරණ ලිපිය මගින් දන්වා ඇත්තේ, රජයේ කාර්මික විද්‍යාල මගින් පවත්වනු ලබන එක් අවුරුදු පූර්ණ කාලීන සැලසුම් ශිල්පී ආධුනික පාඨමාලා ගණයට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලැබූ පූර්ණ කාලීන එක් අවුරුදු සැළසුම් ශිල්පී පාඨමාලාව ද අයත් වන බවයි.

ඒ අනුව පැමිණිලිකරුවන් තිදෙනා විසින් ඉදිරිපත් කර තිබෙන සුදුසුකම් පිළිගත හැකි වුවද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සිදුකල යුතු බැවින් නව බඳවා ගැනීම් සිදුනොවන බවත්, "සැමට ජලය" ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බවත්, ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු අනුව බඳවා ගැනීම් සිදුකිරීමේදී මෙම පැමිණිලිකරුවන් තිදෙනා කෙරෙහි ප්‍රමුඛතාවය දක්වා කටයුතු කිරීමට හැකියාව පවතින බවත් වගඋත්තකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන් මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරික්ෂණයේදී සඳහන් කර ඇත්තේ, "සැමට ජලය" ව්‍යාපෘතිය මේ වන විට අවසන්ව ඇති බව වගඋත්තරකරුවන් විසින් දන්වා තිබුණද, එම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් සැළසුම් ශිල්පීන් තවදුරටත් ජාතික ජලසම්පාදන මණ්ඩලයේ සේවයේ යෙදෙන බවත් ඔවුන්ගේ සේවය අවසන්ව නොමැති බවත් ය.

මේ පිළිබඳව නැවත වරක් ජාතික ජලසම්පාදන මණ්ඩලය වෙත 2023.03.07 දිනැති ලිපිය යොමු කරමින් කොමිෂන් සභාව විසින් කරුණු විමසීමක් කර ඇති අතර, එහිදී ජාතික ජලසම්පාදන මණ්ඩලයේ වැඩ බලන අතිරේක සාමාන්‍යාධිකාරී විසින් 2023.04.19 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ, සැමට ජලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්වයේ නොමැති බවත්, කොන්ත්‍රාත් පදනමින් මෙම ව්‍යාපෘතිය සඳහා සේවයට බඳවා ගත් සැළසුම් ශිල්පීන්ගේ සේවය පිළිබඳව නිශ්චිත තීරණයක් ගැනීමට නොහැකිව පවතින බවත් ය.

කෙසේ නමුත් වගඋත්තරකර පාර්ශවය විසින්ම (වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී - මානව සම්පත් කළමනාකරණ) කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අංක පි1/අති.සා/උසස්වීම් හා 2024.05.10 දිනැති ලිපිය අනුව, පැමිණිලිකරුවන් සමඟ සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත්ව කොන්ත්‍රාත් පදනමින් සැලසුම් ශිල්පීන් ලෙස ජාතික ජල සම්පාදන මණ්ඩලයේ සේවයට එක් වූ "සැමට ජලය" ව්‍යාපෘතියේ සැලසුම් ශිල්පීන් 12දෙනෙකු රජය විසින් නිකුත් කර ඇති රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාල අංක 03/2022 දරණ චක්‍රලේඛය බාධාවක් කර නොගනිමින් සේවයේ ස්ථිර කර ඇති බව නිරීක්ෂණය වේ. තවද වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ) විසින් යොමු කර ඇති 2024.08.02 දිනැති අංක P9A/Dra/Rec දරණ වාර්තාවට අනුව කොන්ත්‍රාත් පදනමින් සැලසුම් ශිල්පීන් ලෙස ජාතික ජල සම්පාදන මණ්ඩලයේ සේවයට එක් වූ 13දෙනෙකු මේ වන විට එම තනතුරෙහි ස්ථිර කිරීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

නිගමනය :

පැමිණිලිකරුවන් සහ වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇති ඉහත සියලුම ලේඛන හා කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුවන් තිදෙනා ලිඛිත විභාගයකට ඉදිරිපත්ව සම්මුඛ පරික්ෂණයෙන්ද සමත්ව අදාළ තනතුර ලබා ගැනීම සඳහා සියළුම සුදුසුකම් සපුරා සිටින අවස්ථාවකදී මෙන්ම තනතුරේ පුරප්පාඩුද පවතින අවස්ථාවකදී වෘත්තීය සමිතියේ විරෝධය මත පැමිණිලිකරුවන් තිදෙනාට අදාළ තනතුර ලබානොදීමට වගඋත්තරකරුවන් කටයුතු කිරීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම ද, 14(1)(උ) ව්‍යවස්ථාවෙහි සඳහන් නීත්‍යානුකූල රැකියාවක නිරත වීමට තිබෙන අයිතිය ද පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

රජය විසින් නිකුත් කර ඇති රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාල අංක 03/2022 දරණ චක්‍රලේඛය බාධාවක් කර නොගනිමින් පැමිණිලිකරුවන් සමඟ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව කොන්ත්‍රාත් පදනමින් සැලසුම් ශිල්පීන් ලෙස ජාතික ජල සම්පාදන මණ්ඩලයේ සේවයට එක් වූ "සැමට ජලය" ව්‍යාපෘතියේ සැලසුම් ශිල්පීන් 13දෙනෙකු සේවයේ ස්ථිර කිරීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇති බැවින් ඒ හා සමාන සියලු සුදුසුකම් සපුරා ඇති පැමිණිලිකරුවන් තිදෙනා ද සැලසුම් ශිල්පී තනතුරෙහි පිහිටුවීමට කටයුතු කළ යුතුය.

2024.10.15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්. ටී. බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්

පිටපත් :- (1) අමාත්‍යතුමා,
ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

(2) ලේකම්,
ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.